# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.17 පැය 0920 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/76 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - ගම්පහ පොලිස් ස්ථානය.**

2025.01.16 වන දින දහවල් කාලයේ ගම්පහ පොලිස් වසමේ පල්ලිය පාර හා අකරවිට යන ප්‍රදේශවලදී ගම්පහ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් දෙකක් සිදුකර **අයිස් ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 500 ක් සහ අයිස් ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 700 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 27 හා 40 වයස්වල පසුවන මොරගොඩ හා අකරවිට ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**
ගම්පහ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මෝදර පොලිස් ස්ථානය.**

2025.01.16 වන දින රාත්‍රී කාලයේ මෝදර පොලිස් වසමේ ලෙල්ලම ප්‍රදේශයේදී තලංගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 400ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන මෝදර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෝදර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. මාරක රිය අනතුරක් - දක්ෂිණ අධිවේගී මාගර් අපරැක්ක අනුපාලක ස්ථානය.**

2025.01.17 වන දින උදෑසන කාලයේ දක්ෂිණ අධිවේගී මාගර්යේ අපරැක්ක බෙලිඅත්ත අතර ප්‍රදේශයේදී කොළඹ දෙස සිට මත්තල දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් ඉදිරියෙන් ධාවනය වූ සිමෙන්ති පැටවූ ලොරි රථයක පිටුපස ගැටීමෙන් බස් රථයේ රියදුරු ඇතුළු රුසියානු ජාතික විදේශකයින් 12 දෙනෙකු තුවාල ලබා බෙලිඅත්ත රෝහලට ඇතුලත් කරන අවස්ථාවේදී බස් රථයේ රියදුරු මිය ගොස් ඇත.

**මරණකර වයස අවුරුදු 29 ක් වූ දොඩංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

මෘත ශරීරය බෙලිඅත්ත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. බස් රථයේ ගමන් ගත් විදේශ ජාතිකයින් 07 දෙනෙකු තංගල්ල රෝහලට මාරු කර යවා ඇත. අපරැක්ක දක්ෂිණ අධිවේගී මාගර් අනු පාලක ස්ථානය මඟින් වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**